www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

2008 බිඳ වැටීමේ පටන් වසරකට ආසන්න කලක් ගතවූ තැන

Nearly one year since the crash of 2008

# මහ බැංකුව වෙනුවෙන් බර්නාන්කේගේ ක්ෂමාලාපය

**Bernanke's apologia for the Fed**

**2009 අගෝස්තු 25**

2008 වසරේ ආරම්භවූ පෙර නොවූ විරූ මූල්‍ය අර්බුදය හා එක්සත් ජනපදයේ ද ලෝක ආර්ථිකයේ ද මතු අනාගතයේ බලාපොරොත්තු පිලිබඳ ඒකාබද්ධ විග්‍රහයක් ගෙන එමින් මහ බැංකු සභාපති බෙන් බර්නාන්කේ, අගෝස්තු 20-21 දිනවල වයෝමින් ප්‍රාන්තයේ ජැක්සන් හෝල් හි පැවති ලෝක මධ්‍යම බැංකුකරුවන්ගේ වාර්ෂික ග්‍රීෂ්ම සම්මන්ත්‍රනය හමුවේ කථාවක් පැවැත්වීය.

ඔහුගේ කථාව පැවැත්වීමේදී බර්නාන්කේ තෝරාගෙන තිබුනේ දේශපාලන බිම්බෝම්බ පිටියක් හරහා වැටී තිබුනු මාවතක් බව පැවසීම අතිශයෝක්තියක් නොවේ. මූල්‍ය අර්බුදයේ පෙර නොවූ විරූ තීව්‍රත්වය හා (නිසැකව ම) මහ බැංකුව ද අනෙකුත් බැංකු බලධාරීන් ද එය පෙරදැකීමට අසමත්වූවේය යන කාරනය වසං කරමින්, වෝල් වීදියට ඇප දී බේරාගැනීම සඳහා ඩොලර් ට්‍රිලියන ගනනින් මහජන අරමුදල් යොදාගැනීමේ දී 2008 සැප්තැම්බරයේ සිට අද දක්වා මහ බැංකුවේ ක්‍රියාපිලිවෙත ආරක්ෂා කරන අතර, වැඩ කරන ජනතාව කෙරෙහි ආර්ථිකයේ බලපෑම පිලිබඳ අඳුරු ස්වභාවය තිබියදී ම, ඔවුන් සඳහා හොඳ ඉදිරි අනාගතයක් ඇතැයි පුලුල් ජනතා ප්‍රේක්ෂකත්වයට ඔහු පොරොන්දු විය.

අවම වශයෙන් ධනේශ්වරයේ කථිකයන් තුල මූල්‍ය අර්බුදය සාපේක්ෂව පාලනය කර ඇති බවට පැවති සිතුවිල්ල මධ්‍යයේ, වසරකට පෙර තමන්ගේ සභාපතිත්වයෙන් පැවති මෙවැනි ම හමුවක් ගැන සිහිපත් කරමින් බර්නාන්කේ සිය කථාව ආරම්භ කලේය. බර්නාන්කේ හා ඔහුගේ බැංකුකාර හා නියාමන සහකරුවන් 2008 අගෝස්තුවේ ජැක්සන් හෝල් හි දී හමුවන විට ''මූල්‍ය තත්ත්වය නරක පැත්තට තියුනු නැම්මක් ගැනීමට යන බව දැකගත් වෙලඳපොල සාමාජිකයන් ගැන කීමට දෙයක් නැති තරම්ය.''

ඒ වෙනුවට සිදුවූයේ, මධ්‍යම බැංකුකරුවන්ගේ අපේක්ෂාවන්ට පටහැනි ලෙස, ''එලඹි සති කිහිපය තුල සම්ප්‍රදායිකව වැදගත් මූල්‍යායතන ගනනාවක් බිඳවැටී හෝ බිඳ වැටීමට ආසන්න තත්ත්වයකට පත්වී සමහර වැදගත් මූල්‍ය වෙලඳපොල කටයුතු මුලුමනින්ම පාහේ ඇනහිට, ගෝලීය ආර්ථිකය ගැඹුරු පසුබෑමකට අවතීර්න වීය.''

ගෝලීය මූල්‍ය පද්ධතිය තුල විශ්වාසය පිලිබඳ අර්බුදයක් මුදා හරිමින් 2008 සැප්තැම්බර් 15 දින ලේමන් බ්‍රදර්ස් කඩාවැටීමෙන් පසුව, ෆෙඩරල් මහ බැංකුව හා අනෙකුත් මධ්‍යම බැංකු විසින් මූල්‍යායතන නඟාසිටුවීමට ගත් පියවර විස්තර කිරීමට බර්නාන්කේගේ කථාවෙන් වැඩි කොටසක් වෙන් විය. බැංකු ගලවාගැනීම යුක්ති සහගත කිරීම සඳහා ඔහු කිසිදු උත්සාහයක් නොගත්තාක් මෙන්ම ලෝක ධනවාදයේ සම චින්තන පරිපාලකයන් සමූහයක් ඉදිරියේ කල කථාවකින් එවැන්නක් අවශ්‍ය කෙරුනේ ද නැත.

කෙසේ වෙතත් මෙම ආර්ථික බලධාරීන්, බැංකු ගොඩදාගැනීමේ දී පෙන්වූ ආකාරයේ කැපවීමක් හා ධෛර්යයක් දශ ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන්ගේ රැකියා, ජීවන තත්ත්වයන්, සමාජ සහන හෝ නිවාස රැකදීම සඳහා නම් පෙන්වා නැත. එයට පටහැනි ලෙස, මූල්‍ය ප්‍රභූ තන්ත්‍රයන් රැකගැනීම සඳහා අනුගමනය කල පිලිවෙත්හි අත්‍යවශ්‍ය අංගයක් වූයේ වැඩකරන ජන සමූහයන්ගේ ජීවනෝපායන් වනසා දැමීමයි. මූල්‍ය ප්‍රභූ තන්ත්‍රය ඇප මත මුදා ගැනීම වෙනුවෙන් ලෝක කම්කරු පන්තිය බරපැන් දරා ඇතුවා සේම තවමත් දරමින් සිටියි.

''සැලකිය යුතු තරමේ ප්‍රගතියක්'' ගැන සඳහන් කරමින් බර්නාන්කේ මධ්‍යම බැංකුකරුවන්ගේ මැදිහත්වීමෙහි ප්‍රතිපල ගැන උදම් ඇනීය. ඒ අතරම ඔහු, විරැකියාව ආන්තිකව ඉහල මට්ටම් වල රැඳී තිබිය දී ''ආර්ථික පනගැසීම අඩියෙන් අඩියට'' සිදුවනු ඇතැයි ද පිලිගත්තේය.

අඩියෙන් අඩියට සිදුවන මෙම පන ගැසීම පිලිබඳ සංකල්පනය ඕනෑවට වඩා ශුභවාදී යයි පෙන්නුම් කරන සැලකිය යුතු දත්ත සමූහයක් ද තිබේ. එක්සත් ජනපදයේ පුද්ගලික බංකොලොත්වීම් හා

නිවාස අත්පත්කර ගැනීමේ ලිපිගොනු මාසයක් පාසා වාර්තා තබමින් ඉහල නගියි. පාරිභෝගික වියදම් එකතැන පල්වෙන අතර පාරිභෝගික මනෝභාවය 1946 ට පසුව ඉතාම අශුභවාදී තැනකට පත්ව තිබේ. කුටුම්භයන්ගේ නය ඒවායේ ආදායම මෙන් සියයට 123 ක මට්ටමේ පවතියි.

24 වන දින පලවූ ඇසෝසියේටඩ් ප්‍රෙස් සටහනකට අනුව වෝල් වීදිය, 2008 බිඳවැටීමෙහි කොකා ගැස්සූ නය හා උකස්කර සුරක්ෂිතකරනයේ පැරනි එම ක්‍රමවේදයන් තුලින්ම, වඩාත් සංකීර්න හා අවිචක්ෂන උපකරන වලට සමාන දේ දැනටමත් උපයෝගී කර ගනිමින් සිටියි. ''මෑත මාසවල දී ආයෝජන බැංකු, වෙලඳපොල බිඳවැටීමේ හදවතෙහිම පැවති සංකීර්න ආයෝජන ගොනුවලට බොහෝදුරට සමාන සැලැස්මක් වන, පැරනි උකස් සුරැකුම් යලි ගොනුකර නව නිපැයුම් ලෙස ඒවා අලෙවිය සඳහා ඉදිරිපත් කිරීමේ'' යෙදී සිටින බව ප්‍රවෘත්ති සේවය වාර්තා කරයි.

මහ බැංකුව පිලිබඳව ධනේශ්වර විචාරකයෙකු වන අර්ථශාස්ත්‍රඥ නෝරියෙල් රූබිනී 24 වන දින *ෆිනෑන්ෂල් ටයිම්ස්* හි තීරුවක අනතුරු ඇඟවීමක් ලෙස ලියා ඇත්තේ, ''ඉංග්‍රීසි W අකුරේ හැඩය ගත් දෙවරක් පහතට යොමුවූ පසුබෑමක අන්තරාය ඉහල යමින් තිබෙන'' බවයි. මධ්‍යම බැංකු විසින් එන්නත් කරන දැවැන්ත නය හා, ඉහල නගින විරැකියාව හේතුකොටගෙන පාරිභෝගික වියදම් පහත වැටීම යන ද්විත්ව සාධකවල ප්‍රතිවිපාක ඔහු ගෙනහැර දක්වයි.

එහෙත් බර්නාන්කේගේ ප්‍රවේශම් සහගත ශුභවාදය පිලිබඳ අටුවාවට එරෙහිව නැඟී සිටින සැලකිය යුතු කාරනාවක් තිබේ. 2008 අගෝස්තුවේ මහ බැංකු ප්‍රධානියා පල කල අනාවැකිවලට වඩා ඔහු 2009 අගෝස්තුවේ පලකරන අනාවැකි බැරෑරුම්ව ගත යුත්තේ මන් ද?

2008 ගෝලීය බිඳවැටීම පිලිබඳ ඔහුගේ තක්සේරුව තුල සමුලුවට රැස්ව සිටි ගෝලීය ධනවාදයේ ඥාතෘන්ට කීමට කිසිවක් නොතිබුනේ මන්ද යන්න පැහැදිලි කලේ නැත. එහෙත් මධ්‍යම බැංකුකරුවන්ට ගැඹුරු ප්‍රෙහේලිකාවක් ලෙස පෙනීගිය එම කාරනය *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* නම් මවිතයට හේතුවක් වූයේ නැත.

පසුගිය වසරේ ජැක්සන් හෝල් රැස්වීමට දෙමසකට පෙර *ලෝසවෙඅ*, මූල්‍ය සීමාවන් ලිහිල් කරමින් සිටි ෆෙඩරල් මහ බැංකුවේ හා ඒවා තද කරමින් සිටි යුරෝපීය මහ බැංකුවේ විසංවාදී පිලිවෙත් ගැන මෙසේ ලිවීය.

''මෙම ක්‍රියාවලීන් කෙතරම් වේගයෙන් ගමන්කර ඇත් ද යන්න වත්මන් තත්ත්වය පිලිබඳ වඩාත්ම කැපී පෙනෙන අංගයකි. වසරකට පෙර ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ගෝලීය මූල්‍යායතන වෙතින් පලවූ ප්‍රධාන වාර්තා, උද්ධමනයේ අවදානම හා මූල්‍ය කලබැගැනියක ශක්‍යතාව පෙන්වාදී තිබුනි. එහෙත් තවමත් ඒවා සාපේක්ෂව ඈත ක්ෂිතිජයේ කුඩා වලාවන් පමනක් විය. දැන් ලෝක ආර්ථිකය දශක තුනකටත් වැඩි කාලයකට පසුව මුහුන දෙන අතිශය බරපතල අර්බුදය හමුවේ තත්ත්වය නාටකාකාර ලෙස වෙනස්වී තිබේ.''

එක්සත් ජනපද නිවාස උකස්කර වෙලඳපොලේ ආරක්ෂක වැට ලෙස ක්‍රියා කල ප්‍රධානම ආයතන දෙක වන ෆැනී මේ හා ෆ්‍රෙඩී මැක් ගලවා ගැනීමේ භාන්ඩාගාර ඇප දීමෙන් පසුව 2008 ජුලි මාසයේ දී, එම සමාගම් දෙකෙහි කඩා වැටීම ගෝලීය අර්බුදයක් මුදාහරිනු ඇතැයි අපි ලිව්වෙමු.

''එක්සත් ජනපද බැංකු, ආරක්ෂිත අරමුදල්, විශ්‍රාම අරමුදල් හා අනෙකුත් ආයතන මෙම ආයතන දෙක මඟින් සහතික කල සුරැකුම් අතැතිව සිටින අතර, ලෝකය වටා ඇති මධ්‍යම බැංකු, ආන්ඩු හා පුද්ගලික බැංකු ෆැනී මේ හා ප්‍රෙඩී මැක්හි නය වල විශාල ලෙස ආයෝජනය කර තිබේ.''

නව පිලිවෙතේ ප්‍රතිවිපාක පිලිබඳව අපි මෙසේ අනතුරු ඇඟවූයෙමු. ''පොදු අරමුදල් වලින් ෆැනී මේ හා ප්‍රෙඩී මැක් ගලවා ගැනීමට ඇප දීමෙන්, ප්‍රමුඛ මූල්‍යායතන මුදා ගැනීම සඳහා බදු ගෙවන්නන්ගේ මුදල් බොහෝ පුලුල් ලෙස යොදාගැනීමේ පූර්වාදර්ශයක් පිහිටුවනු ඇත.''

බර්නාන්කේ වනාහි, මහා අවපාතය අවධියේ එක්සත් ජනපද මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීමේ විශේෂ සුදුසුකම සහිත, පැලපදියම්වූ ධනේශ්වර අර්ථශාසත්‍රඥයෙකු හා සෑම අතකින්ම බුද්ධිමත් පුද්ගලයෙකි. එහෙත් ඔහුගේ සියලු සමීක්ෂන ද බැංකුවට ලබාගත හැකි ඉමහත් තොරතුරු සම්භාරය ද තිබියදීත් ඔහුට, 1930 ගනන් වලින් පසු ඇතිවූ ලොකුම මූල්‍ය බිඳවැටීම කල්තියා දැකගත හැකිවූයේ නැත. මාක්ස්වාදී ලෝක දෘෂ්ටියකින් සන්නද්ධව සිටින *ලෝසවෙඅ* එය කල්තබා දැක ගත්තාක් සේම, සමාජවාදී සමානතා පක්ෂය 2008 අගෝස්තුවේදී සිය ආරම්භක සමුලුව පවත්වමින් එයට සූදානම් ද විය.

පැට්‍රික් මාටින්

© www.wsws.org